EDCS
අධ්‍යාපන සමුපකාර සමිතිය
கல்வி கூட்டுறவு சங்கம்
Education Co-operative Society

# පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය සඳහා ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් මිලට ගැනීමට මිල ගණන් කැඳවීම

සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණයදෙන සමිතියේ පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය සඳහා ඉඩමක් / ගොඩනැගිල්ලක් සහිත ඉඩමක් මිලට ගැනීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.

එම ඉඩම / ගොඩනැගිල්ල පොළොන්නරුව නගර සීමාව තුළ ප්‍රධාන මාර්ගයකට හෝ අතුරු මාර්ගයකට මුහුණලා පිහිටි ජලය, විදුලිය හා අනෙකුත් පහසුකම් සහිත පර්චස් 10 –15 ප්‍රමාණයේ බිම් කොටසක් විය යුතුය. **(ගොඩනැගිල්ලක් සහිත ඉඩමක් නම් විශේෂ අවධානයක් දක්වනු ඇත)**

**ඉඩම සම්බන්ධව සපුරාලිය යුතු සුදුසුකම් :**

- බෙදා වෙන් කරන ලද පිරිසිදු ඔප්පු සහිත නිරවුල් ඉඩමක් විය යුතුය.
- ඉඩමේ මිනින්දෝරු පිඹුර නගර සභා අනුමැතිය සහිත විය යුතු අතර, ගොඩනැගිල්ලක් පවතින ඉඩමක් නම් එම ගොඩනැගිල්ලේ සැලසුම සඳහා නගර සභා අනුමැතිය සහිත විය යුතුය.
- මේ සඳහා වන අයදුම්පත්‍රය සමිතියේ පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලයෙන්, ප්‍රධාන කාර්යාලයෙන් හෝ www.edcs.lk වෙබ් අඩවිය මගින් ලබාගත හැකිය.
- සම්පූර්ණ කරන ලද අයදුම්පත සමග ඔප්පුවේ පිටපත, මිනින්දෝරු පිඹුර, ගොඩනැගිල්ලක් පවතින්නේ නම්, එහි සැලැස්ම හා ගොඩනැගිල්ලේ ඡායාරූපයක් සහ ඉඩමට ළඟා විය හැකි මාර්ග විස්තරයක්ද ඇතුළත් කර එකී විස්තර සහිත මිල ගණන් ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් ගෙනවිත් 2026.03.27 දින ප.ව. 12.00 ට පෙර ප්‍රධාන සභාපති, සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම්කම හා ණයදෙන සමිතිය, අංක 294, ගාලු පාර, කොළඹ 03 යන ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය.
- මිල ගණන් බහා එවන ලිපි කවරයේ වම්පස ඉහළ **"ඉඩම / ගොඩනැගිල්ල සඳහා මිල ගණන් – පොළොන්නරුව"** යනුවෙන් සඳහන් කර තිබිය යුතුය.
- එදිනම ප.ව. 12.15 ට මිල ගණන් විවෘත කරනු ලබන අතර, මිල ගණන් ඉදිරිපත් කළ අය විසින් බලය පවරන ලද එක් පුද්ගලයෙකු හට එම අවස්ථාවට සහභාගී විය හැකිය.
- ඉඩම / ගොඩනැගිල්ල සමිතිය විසින් පරීක්ෂාවට ලක්කරන අතර, තෝරා ගැනීම සම්බන්ධයෙන් ගරු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලබන තීරණය අවසන් තීරණය වන බව කාරුණිකව සලකන්න.

**එම්.ජී.පී.එල්. ලාල් කුමාර**
**ප්‍රධාන සභාපති,**
**සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම්කම හා ණයදෙන සමිතිය,**
**අංක 294, ගාලු පාර, කොළඹ 03.**
**විද්‍යුත් ලිපිනය : edcsboardroom@gmail.com**
**දුරකථන අංක : 011-2266000, Ex - 1001/1022**